# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1839/1 – 2013 දෙසැම්බර් 02 වැනි සඳුදා – 2013.12.02

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/21/52/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ඇන්සල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, බියගම අපනයන සැකසුම් කලාපය, බියගම.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 22හි, ටී. පියසෝම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

1A – G 18642 – 200 (2013/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/21/52/2013.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ඇන්සල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, බියගම අපනයන සැකසුම් කලාපය, බියගම.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

ඇන්සල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ඔවුන්ගේ 2013 ඔක්තෝබර් මස 15 වැනි දින ලිපියෙන් එහි සේවයේ නියුක්ත පහත නම් සඳහන් වන සේවකයින් එකොළොස් (11) දෙනාගේ සේවය අවසන් කිරීම යුක්තිසහගත ද නැතහොත් එකී සේවකයින්ට කිනම් සහන දියයුතු ද යන්න පිළිබඳව වේ;

1. කේ. ඒ. ඩී. අතුල කමල් කළුආරච්චි
2. එස්. කනපති
3. කේ. කේ. ඒ. ඩී. විපුල කළුආරච්චි
4. ජේ. ඒ. කමල් ජයතිස්ස
5. ඩබ්. ඩී. දසන්ත ජයලත්
6. යූ. ඒ. චන්දන රොෂාන්
7. මුදලිගේ ශාන්ත කුමාර්
8. ඒ. එල්. එම්. නෂාර්
9. ජී. ඒ. එල්. අජිත් ප්‍රියන්ත
10. ජේ. එන්. ජේ. පී. පී. කේ. ජයවික්‍රම
11. ඩී. ජේ. රෝහිත ද සිල්වා.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

12 – 666

---

මගේ යොමු අංකය: IR/15/29/2010.

## (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන කාර්මික ආරාවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 හා 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.06.10 වැනි දින අංක 1709/47 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.06.03 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ෆෂ්ලි අස්හාර් මහතා, අංක 06, රොඩ්රිගෝ පටුමග, දෙහිවල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මෙඩිසෝස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 250, ටොරින්ටන් මාවත, කොළඹ 07.

අතර පවත්නා 2011.05.09 දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එම්. ඩී. කේ. කුලතුංග මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම එම නියෝගය අවලංගු කරන අතර එකී 2011.06.03 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

12 – 667/1

---

මගේ අංකය: IR/15/29/2010.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ෆශ්ලි අස්හාර් මහතා, අංක 06, රොඩ්රිගෝ පටුමග, දෙහිවල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මෙඩිසෝස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 250, ටොරින්ටන් මාවත, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, එගොඩවත්ත, පළමු පටුමග, අංක 213 හි එස්. එම්. එස්. ජයවර්ධන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/15/29/2010.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ෆශ්ලි අස්හාර් මහතා, අංක 06, රොඩ්රිගෝ පටුමග, දෙහිවල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මෙඩිසෝස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 250, ටොරින්ටන් මාවත, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

ෆශ්ලි අස්හාර් මහතා මෙඩිසෝස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවය කළ කාලය තුළ ඔහුට වැටුප් හා අනෙකුත් දීමනා නොලැබීමෙන් යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා එලෙස අසාධාරණයක් සිදුවූයේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

12 – 667/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.